# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2008 අංක 12 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2008 පෙබරවාරි මස 29 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2008 පෙබරවාරි මස 29 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 4.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## 2008 අංක 12 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2008 පෙබරවාරි මස 29 වන දින]

එල්. ඩී.—ඕ. 3/2008.

**2006 අංක 51 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

**1.** (1) මේ පනත 2008 අංක 12 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනතේ විධිවිධාන සියලු කාර්ය සඳහා 2008 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

2006 අංක 51 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** 2007 අංක 47 දරන පනත මගින් සංශෝධිත, (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 51 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු පනතේ 2 වන වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බද්ද පැනවීම.

2. (1) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිෂ්පාදන බදු ගෙවීමට යටත් වන මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දැක්වෙන සංයෝජිත වර්ගීකරණ සංකේත අංකය යටතේ දැක්වෙන ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දැක්වෙන සිලින්ඩර් ධාරිතාවක්, ආසන ධාරිතාවක් හෝ බර සහිත යම් මෝටර් වාහනයක් මත, එම මෝටර් වාහනය ආනයනය කරන අවස්ථාවේ දී (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ '(ඉ)' උපලේඛනය ප්‍රකාර නිශ්චය කරනු ලබන, එම මෝටර් වාහනයේ රේගු වටිනාකම හා ඒ මත අය කරනු ලබන සියලු බදු, ගාස්තු හා අයකිරීම් වලින් සංයුක්ත වන සම්පූර්ණ වටිනාකම මත ඒ උපලේඛනයේ III වන තීරයේ දක්වා ඇති අනුප්‍රමාණයක ප්‍රමාණයට ගණන් බලනු ලබන (මෙහි මින් මතු "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බද්ද යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් පනවා, ආනයනය කරනු ලබන අවස්ථාවේ දී අය කරගනු ලැබිය යුතු ය.

2—PL 002816—4,650 (2008/02)

(2) මේ වගන්තියේ කාර්යය සඳහා "මෝටර් වාහනය" යන යෙදුමට ත්‍රී රෝද රථයක් ඇතුළත් නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට උපලේඛනයක් එකතු කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපලේඛනය එකතු කිරීමෙන්, ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"උපලේඛනය

| *අංකය* | *I වන තීරය සං. ව. සංකේතය* | *II වන තීරය සිලින්ඩර් ධාරිතාව/ ආසන ධාරිතාව/ බර* | *III වන තීරය අනුප්‍රමාණය* |
|---|---|---|---|
| 1. | 8703 | සිලින්ඩර් ධාරිතාව 1600 ට නොවැඩි මෝටර් වාහනයක් | සියයට 5.0 |
| 2. | 8703 | සිලින්ඩර් ධාරිතාව 1600 ට වැඩි නමුත් 2000 ට නොවැඩි මෝටර් වාහනයක් | සියයට 7.5 |
| 3. | 8703 | සිලින්ඩර් ධාරිතාව 2000 ට වැඩි මෝටර් වාහනයක් | සියයට 10 |
| 4. | 8702 | ආසන ධාරිතාව තැනැත්තන් 13 ට වඩා අඩු මෝටර් වාහනයක් | සියයට 10 |
| 5. | 8702 | ආසන ධාරිතාව තැනැත්තන් 13 ක් හෝ ඊට වැඩි නමුත් තැනැත්තන් 17 ට වඩා අඩු මෝටර් වාහනයක් | සියයට 5.0 |
| 6. | 8702 | ආසන ධාරිතාව තැනැත්තන් 17 ක් හෝ ඊට වැඩි මෝටර් වාහනයක් | සියයට 7.5 |
| 7. | 8704 | මෝටර් වාහනයක් (නිශ්චිතව සඳහන් බරක් සහිත) | සියයට 5.0" |

4. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.